## ධර්මපාලතුමා හා භික්‍ෂුන් වහන්සේ

මෙරට ජාතික ව්‍යාපාරයේ විකාශය තේරුම් නොගෙන ජාතික හෙළ උරුමයේ වත්මන් භික්‍ෂු දේශපාලනය හා ඒ පිටුපස ඇති බලවේග අවබෝධකරගත හැකි නො වෙයි. පසුගියදා පවත්වන ලද ඊනියා අභිෂේක සමුළුවකින් පසුව ජාතික හෙළ උරුමයේ නායකයන් ලෙස ගිහියන් ද සිටින බව ප්‍රසිද්ධ කරුණක් වී ඇත. මින් පෙර ද ජාතික හෙළ උරුමයේ ගිහියෝ නිලතල දැරූහ. එහෙත් ජනතාවට ඒ ගැන පැහැදිලි අවබෝධයක් නොතිබුණේ ජාතික හෙළ උරුමයේ උත්තරීතර සභාව නමින් ක්‍රියාකරන භික්‍ෂුන්වහන්සේ පමණක් ජාතික හෙළ උරුමය නමින් ප්‍රසිද්ධියේ වැඩකළ බැවිනි. භික්‍ෂුන් වහන්සේට පමණක් තනිව ම දේශපාලන පක්‍ෂයක් සංවිධානයකිරීමට නොහැකි බව උඩුවේ ධම්මාලොක හිමියන් පවසා ඇත්තේ ඊනියා අභිෂේක සමුළුවේ වුවත් ඉන් පෙර සිට ම ඒ පක්‍ෂයේ ගිහියෝ කටයුතු කළ හ. ඒ බව කාහටත් වඩා හොඳින් මැතිවරණ කොමසාරිස්වරයා දනියි.

ව්‍යාජ ජාතික ව්‍යාපාරයක ආරම්භය නමින් 2004 මැයි 9 වැනි ඉරිදා දිවයින සංග්‍රහයෙහි පළ වූ දැක්මෙහි සඳහන් පරිදි 1848න් පසුව විශේෂයෙන් ම දහනවවැනි සියවසේ අවසාන භාගයේ සිට මෙරට ජාතික ව්‍යාපාරය ප්‍රභේද දෙකකින් සමන්විත විය. එකක නායකත්වය දැරුවෝ ඕල්කට් බෞද්ධයෝ වූහ. අනෙක අනගාරික ධර්මපාලතුමා නායකත්වය දුන් සිංහල බෞද්ධයන්ගේ ජාතික ව්‍යාපාරය විය. හඳුනාගැනීමේ පහසුව සඳහා මේ ප්‍රභේද පිළිවෙළින් ඕල්කට් ව්‍යාපාරය හා ධර්මපාල ව්‍යාපාරය නමින් හඳුන්වමු. මෙයින් ඕල්කට් ව්‍යාපාරය ව්‍යාජ ජාතික ව්‍යාපාරයක් කරා විකාශය වූ අතර එහි නායකයෝ පසුව එක්සත් ජාතික පක්‍ෂය නමින් බිහි වූ පක්‍ෂයේ හා එයට මුල් වූ ජාතික සංගමය වැනි සංවිධානවල සාමාජිකයෝ වූහ. ඕල්කට් ව්‍යාපාරයේ ඕල්කට් බෞද්ධයන්ට සිංහල බෞද්ධකම ගැන අවබෝධයක් නොතිබිණි. මොවුන් බිහිකරනු ලැබුයේ ඉංගිරිසින් විසින් ඇතිකරනු ලැබූ පාසල්වලින් හා පසුව ඕල්කට්තුමා ප්‍රමුඛ පිරිස විසින් ඉංගිරිසි ක්‍රිස්තියානි සංස්කෘතිය පදනම් කරගනිමින් ම පිහිටුවන ලද බෞද්ධ පාසල්වලිනි. මෙයින් අදහස්කරන්නේ ඕල්කට් බෞද්ධයකු වීමට මේ කිනම් ආකාරයක හෝ පාසලක ශිෂ්‍යයකු හෝ ශිෂ්‍යාවක හෝ වීම අනිවාර්ය හෝ ප්‍රමාණවත් හෝ යන්න නොවන බව අවධාරණය කළ යුතු ය. ධර්මපාලතුමා ද ඉගෙනගත්තේ ඉංගිරිසින් විසින් පිහිටුවන ලද පාසල්වල ය. එහෙත් එතුමාට ඕල්කට් බෞද්ධයකු නොවීමට තරම් අන්තර්ඥානයක් විය.

අනගාරික ධර්මපාලතුමා එකල සිංහල බෞද්ධයා නමින් පුවත්පතක් පළ කෙළේ ය. ධර්මපාල ව්‍යාපාරය හා ඕල්කට් ව්‍යාපාරය අතර අරගලය මේ පුවත්පතින් මෙන් ම එයට පෙර මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියන් විසින් පළකරන ලද පුවත්පතින් ද හෙළිවෙයි. ඕල්කට්තුමාට කිසිම දවසක සිංහල බෞද්ධ සංස්කෘතිය වැළඳගැනීමේ හැකියාවක් නො වී ය. මිහිඳු මහා රහතන්වහන්සේ මෙරටට වැඩම කිරීමෙන් පසුව බෝධින්වහන්සේ හඳුන්වාදුන්නේ සිංහල සංස්කෘතියෙහි වූ වෘක්‍ෂ වන්දනාවට පිටු නොපාමිනි. ඉන් පසු කලෙක අපට දළදා වහන්සේ ලැබිණි. ශ්‍රී මහා බෝධීන් වහන්සේත් දළදා වහන්සේත් සිංහල බෞද්ධ සංස්කෘතියෙහි අති පූජනීය වෙති. එහෙත් සංස්කෘතික වශයෙන් සිංහල බෞද්ධයකු නොවූ ඕල්කට්තුමා දන්තධාතුන් වහන්සේ ගැන ප්‍රශ්න කෙළේ අදත් ඕල්කට් බෞද්ධයන් මහා ඉහළින් අගයකරන බටහිර ක්‍රිස්තියානි විද්‍යාවේ ආධාරයෙනි. මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියන් ඕල්කට්තුමාගේ නරුම ප්‍රකාශයට පිළිතුරු දුන් බව පමණක් මෙහි සඳහන් කරමි. ඕල්කට්තුමා මෙන් නොව සීකිම් රටෙන් මෙහි පැමිණ පැවිදි වූ ඇස් මහින්ද හිමියෝ සිංහල බෞද්ධ සංස්කෘතිය වැළඳගත්හ. උන්වහන්සේ දළදා වහන්සේට අපහාස නොකළහ. උන්වහන්සේ ඕල්කට්තුමා මෙන් බෞද්ධකම සිංහලකමෙන් වෙන් නොකළහ. සිංහල බෞද්ධයන්ගේ නිදහස වෙනුවෙන් කටයුතු කිරීමට උන්වහන්සේට හැකිවූයේ එබැවිනි.

ධර්මපාලතුමා සිංහල බෞද්ධයකු ලෙස අලජ්ජි භික්‍ෂුන් වහන්සේ විවේචනය කෙළේ ය. අලජ්ජි භික්‍ෂුන් වහන්සේ විවේචනයකිරීම සිංහල බෞද්ධ සම්ප්‍රදායට විරුද්ධ නො වෙයි. එහෙත් ඕල්කට් බෞද්ධයෝ ඒ බව අද මෙන් ම එදා ද නොදත්තෝ ය. ඔවුහු ධර්මපාලතුමාට පහර පිට පහර ගැසූහ. (ධර්මපාලතුමා අලජ්ජී භික්‍ෂුන් වහන්සේ විවේචනයකිරීම ගැන විරුද්ධ වූ ඕල්කට් බෞද්ධයෝ පසුකලෙක තම දේශපාලන අවශ්‍යතා මුදුන්පත් කරගැනීමට විද්‍යාලංකාර භික්‍ෂුන්වහන්සේට පහර දුන්හ!). ඕල්කට් බෞද්ධයන්ගේ පහරදීම්වලින් කළකිරී සිටි ධර්මපාලතුමා සිංහල

© Prof. Nalin De Silva

බෞද්ධයා පුවත්පතෙහි පළකළ අදහස් කිහිපයක් පහත පළවෙයි. ඒ උපුටාගෙන ඇත්තේ මැදගම ධම්මානන්ද හිමියන් විසින් කලකට පෙර සකස්කර දිවයින පුවත්පතෙහි පලකරන ලද ලිපියකිනි.

“වර්තමාන කාලීන උපාසක උපාසිකාදීන් ධර්ම විනය නොදැනීම නිසා ඇතැම් අලජ්ජී දුස්සීල භික්ෂූන්ට ගරු සත්කාර කරනු ලැබේ. අපි වඳින්නේ සිවුරටයි. උන්වහන්සේලා ගැන සොයන්නට අපට කාරණයක් නැත යනු ඔවුන්ගේ මතයයි. එසේ නම් ලී කොටයකට සිවුරක් පොරවා වැන්දාම ඇත. ගේහසිත උපේක්ෂාවෙන් මෙසේ උත්තර දීම බාල පෘථග්ජනයින්ගේ ගතියකි. මිත්‍යාදෘෂ්ටි පරවාද මර්දනය කිරීම සම්‍යක් දෘෂ්ටික සත්පුරුෂයන් විසින් කටයුතුයි. දඹදිව බුද්ධ ශාසනය හීන වෙන්නට පටන් ගත්තේ මීට වර්ෂ 1000 කට ප්‍රථමයි. පළමුකොට ශාසනය හානියට පත් කළේ එකල විසූ අලජ්ජී භික්ෂූන්ය.” (සිංහල බෞද්ධයා 1911 මාර්තු 25). “නායක පදවි ලබාගැනීමට නොයෙක් ප්‍රයත්න කර එය ලබාගෙන කරන්නේ මොකද? විශේෂ දුම්රියෙන් ගමන් කිරීම අසුන් දෙන්නකු බැඳපු රථයකින් ගමන් කිරීමාදියයි. ගිහියන්ගේ ආවාහ විවාහ මංගල්‍යවලට සමානව කටයුතු කරන්නට පටන්ගෙන මේ කරගෙන යන විකාර බුදුරජාණන් වහන්සේට කරන නින්දාවකි.” (සිංහල බෞද්ධයා 1911 ජුලි 22) “පන්සල්වල සිටින සාමණේරවරුන්ට ද නිති වතාවත් කරවීම කටයුතුයි. ලංකාවේ මහා තෙරුන් වහන්සේලා බොහෝ පන්සල්වල සාමණේරවරුන්ට හයින් හිතු දේ කරන්නට ඉඩ දී සිටිති. මහා තෙරුන්වහන්සේලා චරිත ආදර්ශයට ගත යුතු අන්දමට නොපවත්වන බැවින් සෘජු සිතින් සාමණේරවරුන්ට අවවාද කිරීමට හිතට ශක්ති උපදින්නේ නැත.” (සිංහල බෞද්ධයා 1912 මාර්තු 16). “දැනට බොහෝ විහාරවල ප්‍රාකාර බැමි ගිහි කාමභෝගීන්ගේ වාසස්ථානවල බඳින ගණනට බැඳ තිබේ. වටකර ගෙන තිබෙන ගිහි ගෙවල්වල සිටින ස්ත්‍රී පුරුෂයන්ගේ රූප, ශබ්ද, ස්පර්ශ කිරීමෙන් බ්‍රහ්ම චර්යාව ක්ලිෂ්ට වන්නේ ය. කාමභෝගීන් මෙන් කල් යවන භික්ෂූන්ගෙන් නම් ලොවට වැඩක් නැත්තේමය.” (සිංහල බෞද්ධයා 1912 අප්‍රියෙල් 20).

ඉහත සඳහන් ප්‍රකාශ කිහිපයෙන් පවා පෙනී යන්නේ ධර්මපාලතුමා අලජ්ජී භික්ෂූන් සම්බන්ධයෙන් ක්‍රියාකළ ආකාරය ය. අද ද ඒ දේ එසේම සිදුවෙයි. එහි වෙනස්කිරීමට ඇත්තේ අසුන් දෙන්නකු බැඳපු රථයකින් යන්න පමණ ය. ඒ වෙනුවට සුඛෝපභෝගී මෝටර් රථ යන්න යොදාගත හැකි ය. ධර්මපාලතුමා ඕල්කට් බෞද්ධ සංස්කෘතිය ගැන ද ඉවකින් මෙන් දැන සිටින්නට ඇත. මේ වාක්‍යය ඕල්කට් බුද්ධාගම ගැන අන්තර්ඥානයකින් මෙන් ලියන ලද්දකි. “පියා බුද්ධාගම අදහතත් යෞවන මදාදියෙන් මත් වී දූ දරුවෝ ක්‍රිස්තියානියට නොගියත් කාමරසාස්වාදය පිණිස පියසතු ධනය විනාශ කොට ව්‍යසනයන්ට පැමිණෙත්.” (සිංහල බෞද්ධයා 1911 අගෝස්තු 12).

ඉංගිරිසින් එකල භයවූයේ ධර්මපාලතුමාට පමණ ය. ඒ එතුමා සැබෑ ජාතික ව්‍යාපාරයෙහි නිරත වූ බැවිනි. එහෙත් ඕල්කට් බෞද්ධයෝ අවසානයේ දී එතුමාට රට අත්හැර යන තැනට පහර දුන්හ. එතුමාගේ වචනවලින් ම අපි එතුමාට අත්කරදුන් ඉරණම සඳහන් කරමු. මෙහි එතුමා සිංහල බෞද්ධයන් යන්න යොදා ඇත්තේ සංකල්පීය වශයෙන් එතුමා නිරවුල් නොවූ බැවින් යැයි සිතමි. එකල ඒ සංකල්පීය නිරවුල්බව ඇතිකරගැනීම සඳහා වටාපිටාවක් නොවී ය. සිංහල බෞද්ධයන් යන්න වෙනුවට ඕල්කට් බෞද්ධයන් යනුවෙන් මේ ඡේදය කියවීමෙන් සිදුවූයේ කුමක් ද යන්න අවබෝධකරගත හැකි ය. “වරද දුටු තැන වරද කියාදීම මගේ ධර්මතාවකි. මධ්‍යම රැය ගතවී දෙපැයක් ගිය තැන නින්දෙන් නැගිට එතැන් පටන් ධර්මාවවාද වාක්‍ය ලිවීමට කාලය ගතකළෙමි. එසේ මවිසින් ප්‍රේම සිතින් දෙන අවවාද පිළිගැනීමට සිංහල බෞද්ධයන් විරුද්ධ බැවින් අවවාද කිරීමට මගේ කාලය ගතකිරීම අප්‍රයෝජන බව මට පෙනේ. ක්‍රෝධ සිතින් ක්‍රියාකරන මනුෂ්‍ය සමූහයා අතර නතරවීම සමාධි භාවනාවට හේතු නොවන්නේ ය. මෛත්‍රී කරුණා ඇති සත්පුරුෂයන් දෙදෙනකුවත් ආශ්‍රය කිරීමට නැති බැවින් සංවේගයෙන් සිටිමි. ලබන මාසයේදී පමණ බුදු පසේබුදු මහ රහතුන්ට ද, චක්‍රවර්ති රජවරුන්ටද සැපදෙන මධ්‍ය මණ්ඩල දිසාභිමුඛව ගමන් කරන්නෙමි.” (සිංහල බෞද්ධයා 1912 මාර්තු 30).

© Prof. Nalin De Silva